චක්‍රලේඛ අංක :- ...08.... / ..2018

මගේ අංකය :- කේ.07/05/නිවාස නිවාඩු/විවිධ/ 50 /2018,
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09,
2018.03.28 වන දින.

සියළුම බන්ධනාගාර අධිකාරී සහ,
සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත.

**<u>සිරකරුවන් බලපත්‍රමත මුදා හැරීම සහ නිවාස නිවාඩු යැවීම</u>**

සිරකරුවන් බලපත්‍රමත මුදා හැරීම සහ නිවාස නිවාඩු යැවීම සම්බන්ධයෙන් මගේ අංක : ධබ/08/බලපත්‍ර/2017 හා 2017.12.26 වන දිනැති චක්‍රලේඛ අංක :- 27/2017 ලිපිය මගින් ලබා දී ඇති නියෝගයන්ට අමතර වශයෙනි.

01 . බන්ධනාගාරය තුල, තහනම් භාණ්ඩයක් වන ජංගම දුරකතන, සිම් කාඩ්පත්, බැටරි, චාජර්, හැන්ඩ් ෆ්‍රී (ඒ සඳහා උපයෝගී කර ගන්නා සියළුම භාණ්ඩ හා උපකරණ) හා මත්ද්‍රව්‍ය (හෙරොයින්, හෂීස්, ගංජා, අබිං) යන නීති විරෝධී ද්‍රව්‍යයන් භාවිතය හෝ සන්තකයේ තබා ගැනීමට වරදකරුවන් වන සිරකරුවන්, ඒ සඳහා වරදකරු කරන දින සිට අවුරුදු 02ක් ඉක්මවා යන තුරු බලපත්‍රමත මුදා හැරීම සහ නිවාස නිවාඩු වරප්‍රසාද අහිමි කරනු ලබන අතර, දීර්ඝ කාලීන සිරකරුවන් සඳහා ක්‍රියාත්මක කරනු ලබන විශේෂ කමිටුවට ඉදිරිපත් කිරීමේ අවස්ථාව අහිමි කරන බව මෙයින් දන්වා සිටිමි.

02. මෙම නියෝගය 2018.04.01 වන දින සිට ක්‍රියාත්මක කල යුතු බව දන්වමි.

එච්.එම්.එන්.සී.ධනසිංහ,
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ - 09.

පිටපත :- ලේකම්,
බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන,
නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යංශය,
අංක : 356, ගාලු පාර,
කොළඹ 03.
} කරු : දැණ ගැනීම පිණිස.